# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 10.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 51/2021

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — 2002 අංක 14 දරන පනතේ 25ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ "2016 නොවැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සියයට පහළොවක් විය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "2016 නොවැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන එහෙත් 2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට පහළොවක් විය යුතු ය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(උ) 2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සියයට දහඅටක් විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) එම ඡේදයේ (xxxi) වන අයිතමයේ "2020 මැයි මස 20 වන දින සිට බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 මැයි මස 20 වන දින සිට බලාත්මක එහෙත් 2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;";

(2) (xxxi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(xxxii) සෞඛ්‍යය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිර්දේශ කර මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු යම් වසංගත තත්ත්වයක් හෝ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන හදිසි තත්ත්වයක් හමුවේ කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ ද යම් රජයේ රෝහලකට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද්දා වූ ද වෛද්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණික උපකරණ, උපාංග සහ ඒවායේ කොටස්, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය.".

වලංගු කිරීම

4. 2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භව, මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු රැස්කිරීමට බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි අධිකාරී බලය සහිතව ක්‍රියාකර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, ඒ බද්ද එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කරනු ලැබ ඇති බවට සහ වලංගු බවට සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් උද්ගත විය හැකි සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් එම තැනැත්තා මෙයින් හානිපූරණය කරනු ලැබේ:

එසේ වුව ද, එම කාලසීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයක් හෝ ආඥාවක් සම්බන්ධයෙන් හෝ යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් ඉහත කී විධිවිධාන බල නොපෑ යුතු ය.

**5.** සැක දුරු කිරීම සඳහා, යම් නිශ්චිත ආයතනයක් හෝ යම් තැනැත්තකු විසින්, 2022 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත බලාත්මක වන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවකට අදාළව මේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව බද්ද ගෙවා නොමැති අවස්ථාවක, ඒ ආයතනය හෝ ඒ තැනැත්තා විසින් මේ පනත බලාත්මක වන දිනට පසුව එළඹෙන මාසයේ විසිවන දිනට පෙරතුව ඔහු විසින් ගෙවිය යුතු බදු මුදල ගෙවනු ලබන්නේ නම්, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව ඒ නිශ්චිත ආයතනය හෝ තැනැත්තා ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු නොලැබිය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

බදු ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු නොලැබිය යුතු බව

**6.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.